# රාජ්‍ය මූල්‍ය කටයුතු

## සමස්ත උපනතීන්

ආර්ථික ස්ථායීකරණ අරමුණ ඉටු කරගැනීමේදී දැරිය හැකි අයවැය හිඟයක් 1990 වර්ෂයේදී ද පවත්වා ගැනීම කෙරෙහි, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන් වඩාත් ප්‍රබල ලෙස යොමු විය. මේ අනුව 1990 වර්ෂයේදී අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් සියයට 10 ක්ව පවත්වාගත හැකි වූ අතර, ප්‍රසාරණාත්මක මූලයයන්ගෙන් අයවැය හිඟය පියවීම මුළුමනින්ම වාගේ ඉවත් කර ගැනීමටද හැකි විය. 1988 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15 ක් ඉක්ම වූ අයවැය හිඟය 1989 වර්ෂයේදී සියයට 11 දක්වා අඩු විය. නව ආදායම් පිළිවෙත් තුළින් පුළුල් කරනු ලැබූ ආදායම් රැස්කිරීමේ ප්‍රයත්නයන් 1990 දී ආදායම් දළ දේශීය නිෂ්පාදිත අනුපාතය සියයට 21.2 ක්ව පවත්වා ගැනීමට දායක විය. මෙම ආදායම් මට්ටම පෙර වර්ෂයේ පැවති ආදායම් මට්ටමට බෙහෙවින් සමානය. මේ අතර දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 32.6 ක්ව පැවති රජයේ වියදම මූලික වශයෙන මැත බැලීම්වලදී ක්‍රියාත්මක කරනු ලැබූ විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රම නිසා 1990 වර්ෂයේදී සියයට 31.1 ක්ව පවත්වා ගත හැකි විය. පෙර වර්ෂයේ සියයට 22.6 ක්ව පැවති වර්තන වියදම්/ද.දේ.නි. අනුපාතය මෙම වර්ෂයේදී සියයට 22.4 දක්වා ආන්තික වශයෙන් අඩු වූ අතර ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1989 දී සියයට 10 සිට 1990 දී සියයට 8.8 දක්වා අඩු විය. මේ අනුව, මෑත වර්ෂවල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්කම් වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් ලෙස රාජ්‍ය ආයෝජනයේ ක්‍රමානුකූල පහත වැටීම පෙන්නුම් කළ හැකිය.

අයවැය හිඟය පියවීමේදී, දේශීය ණය ගැනීම්, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.9 ක්ව පවත්වාගත හැකි වූ අතර, එය 1989 දී සියයට 4.9 ක් හා 1988 දී සියයට 9.5 ක්ව පැවතිණ. පෙර වර්ෂයේදී මෙන්ම දේශීය ණයගැනීම් වලින් විශාල ප්‍රමාණයක් බැංකු නොවන මූලයන්ගෙන් රැස්කර ගනු ලැබූ අතර, එබඳු ණය ගැනීම් වලින් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ලබා ගන්නා ලදී. අයවැය කටයුතු සඳහා විදේශීය ණය හා දීමනා වශයෙන් ලැබුණ සම්පත් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1989 දී සියයට 4.9 සිට 1990 දී සියයට 5.7 දක්වා වැඩි විය.

### අයවැය තත්ත්වය

1990 දී රුපියල් දශ ලක්ෂ 67,964 ක්වූ රජයේ ආදායම සියයට 26 ක වැඩිවීමක් වාර්තා කළ අතර, රුපියල් දශ ලක්ෂ 71,771 ක්වූ වර්තන වියදම් ප්‍රමාණයද සියයට 26 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ අනුව රුපියල් දශ ලක්ෂ 3,807 ක හිඟයක් අයවැයෙහි වර්තන ගිණුම් කටයුතු වලින් ඇති විය. පසුගිය වර්ෂයේ වර්තන ගිණුමේ හිඟය වූයේ රුපියල් දශ ලක්ෂ 2,905 කි. ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන පිරිවැටුම් බදු, ආනයන බදු හා අලෙවි බදු 1990 දී වැඩි ආදායම් ඇති කරන ලදී. මෙම ප්‍රභවයන්ගේ ආදායම් වර්ධනය බදු/ද.දේ.නි. අනුපාතය 1989 දී පැවති සියයට 18.9 සිට 1990 දී සියයට 19.1 දක්වා වැඩිකර ගැනීමට දායක විය.

මේ හා සමාන තත්ත්වයන් පිළිබිඹු කරමින් පොළී ගෙවීම්, වෙනත් භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම්, කුටුම්භ සඳහා වූ පැවරුම් ආදී සමහර වියදම් 1990 දී සැළකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මුළු වියදමින් සියයට 21 කට ආසන්න වූ රාජ්‍ය ණය සඳහා පොළී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් 1989 සියයට 5.7 සිට 1990 දී සියයට 6.4 දක්වා ඉහළ නැගුණි. එමෙන්ම වෙනත් භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම් ද දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 1989 සියයට 4.4 සිට 1990 දී සියයට 4.5 දක්වා වැඩි විය. ආහාර මුද්දර, දිවා ආහාර සහ ජනසවිය වැඩපිළිවෙල සඳහා යොමු කරන ලද මුළු වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.8 සිට සියයට 2.4 දක්වා වැඩිවිය. එනමුත් වැටුප් හා වේතන සහ විශ්‍රාම වැටුප් සඳහා කරන ලද වියදම් දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව පෙර වර්ෂයේ පැවති සියයට 7.6 සිට 1990 දී සියයට 6.3 දක්වා පහත වැටිණ. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින් මුළු වර්තන වියදම්/දළ දේශීය නිෂ්පාදිත අනුපාතය පෙර වර්ෂයේ පැවති සියයට 22.6 මට්ටමේ සිට 1990 දී

සියයට 22.4 දක්වා වෙනස් විය. ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම් දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව 1989 පැවති සියයට 10.0 සිට 1990 දී සියයට 8.8 දක්වා පහත වැටුණි. මේ අනුව මුළුමනින්ම පාහේ රාජ්‍ය ආයෝජන මට්ටමෙහි කරන ලද ගැළපුම් පිළිබිඹු කරමින් මුළු වියදම්/දළ දේශීය නිෂ්පාදිත අනුපාතය සියයට 32.6 සිට සියයට 31.1 දක්වා පහත වැටුණි.

ආදායම් හා වියදම් යන දෙඅංශයෙහිම ඇතිවූ මෙම වර්ධනයන් රුපියල් දශ ලක්ෂ 31,850 (ද.දේ.නි. යෙන් සියයට 9.9) සමස්ත අයවැය හිඟයක් (දීමනා වලට පෙර) ඇති කිරීමට හේතු විය. පසුගිය වර්ෂයේ සමස්ත අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 28,185 (ද. දේ. නි. යෙන් සියයට 11.2) ක් විය. කෙසේ වුවද, විදේශීය ණය හා දීමනා වලින් ආසන්න වශයෙන් අයවැය හිඟයෙන් සියයට 60 ක් පමණ පියවා ගතහැකි වූයෙන් අයවැය හිඟය පියවීම සඳහා වූ දේශීය ණය අවශ්‍යතාව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.9 දක්වා අඩු කරගන්නා ලදී. 1990 වර්ෂයේදී අයවැය හිඟය පියවීමේදී දක්නට ලැබුණු විශේෂ ලක්ෂණය වූයේ දේශීය ණය ගැනීම් අවශ්‍යතාවය මුළුමනින්ම පාහේ දේශීය බැංකු නොවන අංශයන්ගෙන් සපුරාගත හැකි වීමය. බැංකු නොවන දේශීය අංශයන්ගෙන් ලබා ගන්නා ලද සම්පත් වලින් රුපියල් දශ ලක්ෂ 10,437ක් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ලබාගන්නා ලද අතර, ඉතිරිය රුපියල් සුරැකුම් සහ ජාතික ආරක්ෂක බැඳුම්කර වැනි මැදි හා දිගුකාලීන රජයේ සුරැකුම් මගින් සපයා ගන්නා ලදී. මේ අනුව 1990 දී දේශීය මූලාශ්‍රයන්ගෙන් අයවැය හිඟය පියව්මේදී කෙටිකාලීන ණය ගැනීම් මත වැඩි රඳා පැවැත්මක් දක්නට ලැබුණි. 1986–1991 රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනයක් 1.48 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**ආදයම**

1990 දී රජයේ ආදායම් රුපියල් දශ ලක්ෂ 67,964 ක් විය. මෙය පසුගිය වර්ෂයේ ආදායම වූ රුපියල් දශ ලක්ෂ 53,979 සමඟ සසඳා බලන කළ සියයට 26 ක වැඩිවීමකි. රුපියල් දශ ලක්ෂ 61,206 ක් වූ බදු ආදායම් සියයට 29 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, පෙර වර්ෂයේදී මෙන්ම එය මුළු ආදායමින් සියයට 90 කට පමණ දායක විය. 1989 මුළු බදු ආදායමින් සියයට 44 ක්ව පැවති භාණ්ඩ හා සේවා මත පනවනු ලැබූ බදු ආදායම 1990 දී සියයට 47 දක්වා ඉහළ නැඟුන අතර, ජාත්‍යන්තර වෙළඳාම මත පදනම් වූ බදුවල දායකත්වය සියයට 35 සිට 32 දක්වා පහත වැටුණි. ඉකුත් වර්ෂයේදී මෙන් ආදායම් බදු මුළු බදු ආදායමින් සියයට 12 ක්ව පැවතුණි. දේපල ආදායම් මත පැනවූ බදුවල කොටස සියයට 5 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

1990 දී රුපියල් දශ ලක්ෂ 6,758 ක්වූ බදු නොවන මූලාශ්‍රයන්ගෙන් ලැබුන ආදායම සියයට 4.5 ක ආන්තික වැඩිවීමක් පෙන්නුම් කළේය. පසුගිය වර්ෂයට වඩා දෙගුණයක වැඩිවීමක් පෙන්නුම් කළ රුපියල් දශ ලක්ෂ 2,235 ක්වූ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මෙහයුම් අතිරික්තය මුළු බදු නොවන ආදායමෙන් තුනෙන් එකකට දායක විය. 1990 දී පරිපාලන සේවා හා ගාස්තු සහ පොළී ආදායම් මුළු බදු නොවන ආදායමින් සියයට 29 කට දායක විය.

දේශීය භාණ්ඩ හා සේවා මත පැනවූ බදු වලින් රැස්කර ගන්නා ලද ආදායම් රුපියල් දශ ලක්ෂ 28,770 ක් වූ අතර, පෙර වර්ෂයේ පැවති සියයට 22 ක වර්ධනය හා සසඳා බලන කළ සියයට 38 ක සීඝ්‍ර වර්ධනයක් වාර්තා කළේය. රුපියල් දශ ලක්ෂ 20,291 ක්වූ පිරිවැටුම් බදු දේශීය භාණ්ඩ හා සේවා මත බදු ආදායමින් සියයට 71 ක්වූ අතර, මෙය පසුගිය වර්ෂයේ ලැබූ ආදායමට වඩා සියයට 38 ක වැඩිවීමකි. නිමැවුම් වටිනාකම වැඩිවීම සහ වැඩි කරන ලද බදු අනුපාත හේතුකොට ගෙන නිෂ්පාදන කටයුතු මත පැනවූ පිරිවැටුම් බදු ආදායම රුපියල් දශ ලක්ෂ 6,798 ක් වූ අතර, එය සියයට 51 ක වර්ධනයක් වාර්තා කළේය. 1990 දී සුඛෝපභෝගී හා අර්ධ සුඛෝපභෝගී භාණ්ඩ විශාල සංඛ්‍යාවක් සියයට 20 හා සියයට 40 ක බදු අනුපාතයන්ට යටත්වූ අතර, පසුගිය වර්ෂය හා සැසඳීමේදී මෙම අනුපාත පිළිවෙලින් සියයට 15 හා සියයට 20 විය. එමෙන්ම 1990 දී නිෂ්පාදිත හා ආනයනය කරන ලද භාණ්ඩ සියයට 6 සහ සියයට 15 වශයෙන් වූ පිරිවැටුම් බදු අනුපාතවලට යටත් වූ අතර, 1989 දී මෙම අනුපාත පිළිවෙලින් සියයට

## 1.48 සංඛ්‍යා සටහන

### රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදායම සහ දීමනා .. .. | 40,991 | 46,822 | 48,337 | 60,386 | 68,062 | 74,662 | 79,529 |
| මුළු ආදායම .. .. | 37,238 | 42,145 | 41,749 | 53,979 | 61,262 | 67,964 | 71,529 |
| බදු .. .. | 31,272 | 35,119 | 35,946 | 47,513 | 55,920 | 61,206 | 64,899 |
| බදු - නොවන .. .. | 5,966 | 7,026 | 5,803 | 6,466 | 5,342 | 6.758 | 6,630 |
| දීමනා .. .. | 3,753 | 4,677 | 6,588 | 6,407 | 6,800 | 6,697 | 8,000 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම් .. .. | 59,193 | 63,894 | 76,532 | 82,164 | 89,861 | 99,814 | 107,551 |
| වර්තන .. .. | 33,966 | 39,560 | 46,132 | 56,884 | 63,361 | 71,771 | 72,962 |
| ප්‍රාග්ධන .. .. | 23,236 | 22,816 | 22,878 | 20,750 | 21,653 | 19,161 | 28,118 |
| ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම් .. .. | 1,991 | 1,518 | 7,522 | 4,530 | 4,647 | 8,882 | 6,471 |
| වර්තන ගිණුම් අතිරික්තය/හිඟය ( - ) .. .. | 3,272 | 2,585 | - 4,383 | - 2,905 | - 2,299 | - 3,807 | - 1,433 |
| අයවැය හිඟය (දීමනා වලට පෙර) .. .. | -21,956 | - 21,749 | - 34,783 | -28,185 | - 28,599 | - 31,850 | - 36,022 |
| අයවැය හිඟය (දීමනාවලට පසු) .. .. | -18,203 | - 17,072 | - 28,195 | -21,778 | - 21,799 | - 25,153 | - 28.022 |
| පියවීම .. .. | 18,203 | 17,072 | 28,195 | 21,778 | 21,799 | 25,152 | 28,022 |
| විදේශීය ණය ගැනීම් .. .. | 9,061 | 5,716 | 7,128 | 5,926 | 10,558 | 11,644 | 19,883 |
| දේශීය ණය ගැනීම් .. .. | 9,142 | 11,356 | 21,067 | 15,852 | 11,241 | 13,509 | 8,139 |
| වෙළෙඳපොල නොවන(අ) .. .. | - 669 | 1,415 | 1,687 | 5,300 | — | 60 | — |
| වෙළෙඳපොල .. .. | 9,811 | 9,941 | 19,380 | 10,551 | 11,241 | 13,448 | 8,139 |
| බැංකු - නොවන .. .. | 6,765 | 6,400 | 9,227 | 13,838 | 10,199 | 13,074 | 12,639 |
| බැංකු .. .. | 3,047 | 3,541 | 10,153 | - 3,286 | 1,042 | 374 | - 4,500 |

(අනෙක් පිට හා සම්බන්ධයි.)

(අ) 1989 හිඟ වියදම් රුපියල් දශ ලක්ෂ 3,478 කින් වැඩිවීම සඳහා සහ 1990 දී හිඟ වියදම් රුපියල් දශ ලක්ෂ 2,107 කින් අඩුවීම සඳහා ගැලපුම් කර ඇත.


## 1.48 සංඛ්‍යා සටහන හා සම්බන්ධයි

### දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| මුළු ආදයම සහ දීමනා | 22·8 | 23·8 | 21·8 | 24·0 | 24·0 | 23·3 | 21·7 |
| මුළු ආදයම | 20·7 | 21·4 | 18·8 | 21·4 | 21·6 | 21·2 | 19·5 |
| බදු | 17·4 | 17·9 | 16·2 | 18·9 | 19·7 | 19·1 | 17·7 |
| බදු – නොවන | 3·3 | 3·6 | 2·6 | 2·6 | 1·9 | 2·1 | 1·8 |
| දීමනා | 2·1 | 2·4 | 3·0 | 2·5 | 2·4 | 2·1 | 2·2 |
| වියදම් සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම් | 33·0 | 32·5 | 34·5 | 32·6 | 31·7 | 31·1 | 29·3 |
| වර්තන | 18·9 | 20·1 | 20·8 | 22·6 | 22·4 | 22·4 | 19·9 |
| ප්‍රාග්ධන | 12·9 | 11·6 | 10·3 | 8·2 | 7·6 | 6·0 | 7·7 |
| ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් | 1·1 | 0·8 | 3·4 | 1·8 | 1·6 | 2·8 | 1·8 |
| වර්තන ගිණුම් අතිරික්තය/හිඟය ( – ) | 1·8 | 1·3 | – 2·0 | – 1·2 | – 0·8 | – 1·2 | – 0·4 |
| අයවැය හිඟය (දීමනා වලට පෙර) | – 12·2 | – 11·1 | – 15·7 | – 11·2 | – 10·1 | – 9·9 | – 9·8 |
| අයවැය හිඟය (දීමනාවලට පසු) | – 10·1 | – 8·7 | – 12·7 | – 8·6 | – 7·7 | – 7·8 | – 7·6 |
| පියවීම | 10·1 | 8·7 | 12·7 | 8·6 | 7·7 | 7·8 | 7·6 |
| විදේශීය ණය ගැනීම් | 5·0 | 2·9 | 3·2 | 2·4 | 3·7 | 3·6 | 5·4 |
| දේශීය ණය ගැනීම් | 5·1 | 5·8 | 9·5 | 6·3 | 4·0 | 4·2 | 2·2 |
| වෙළෙඳපොළ නොවන | – 0·4 | 0·7 | 0·8 | 2·1 | — | ... | — |
| වෙළෙඳපොළ | 5·5 | 5·1 | 8·7 | 4·2 | 4·0 | 4·2 | 2·2 |
| බැංකු – නොවන | 3·8 | 3·3 | 4·2 | 5·5 | 3·6 | 4·1 | 3·4 |
| බැංකු | 1·7 | 1·8 | 4·6 | – 1·3 | 0·4 | 0·1 | – 1·2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# රාජ්‍ය මූල්‍ය උපනතීන්




ශ්‍රී ලංකා මහ බැංකුව.

5 හා සියයට 12.5 වශයෙන් පැවතිණ. මේ අතර නිෂ්පාදන නොවන පිරිවැටුම් බදු රුපියල් දශ ලක්ෂ 3,726 ක් වූ අතර, පසුගිය වර්ෂයේ සියයට 11 ක පහත වැටීම හා සසඳන කළ සියයට 24 ක වර්ධනයක් වාර්තා විය. ආනයන භාණ්ඩවල වටිනාකම ඉහළ මට්ටමක පැවතීම සහ ආනයන බදු හා පිරිවැටුම් බදු අනුපාත වැඩිකිරීම නිසා ආනයන පිරිවැටුම් බදු රුපියල් දශ ලක්ෂ 9,767 ක් වූ අතර, එය සියයට 36 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

1990 දී සුරාබදු මගින් රුපියල් දශ ලක්ෂ 8,170 ක් රැස් කරන ලද අතර, එය පසුගිය වර්ෂයේ එකතුවට වඩා සියයට 41 ක වැඩිවීමකි. දුම්කොළ නිෂ්පාදන මත පැන වූ සුරාබදු මගින් රුපියල් දශ ලක්ෂ 5,461 ක ආදායමක් ලැබී සියයට 42 ක වර්ධනයක් සටහන් කළ අතර, මත්පැන් මත බදු රුපියල් දශ ලක්ෂ 2,657 ක්ව සියයට 36 ක වර්ධනයක් වාර්තා කළේය. වර්ෂය තුළ බදු අනුපාත ඉහළ නංවමින් කළ සංශෝධන සුරාබදු මගින් රැස් කරන ලද ආදායම් වර්ධනය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය විය. විශේෂිත දුම්කොළ බද්ද කිලෝ ග්‍රෑමයට රුපියල් 1,315 සිට කිලෝ ග්‍රෑමයට රුපියල් 1,565 දක්වා වැඩි කරන ලද අතර, සැර මත්පැන් වර්ග හා බියර් මත පැනවූ විශේෂිත බද්ද පිළිවෙලින් බෝතලයට රුපියල් 5 සහ රුපියල් 2.25 බැගින් වැඩි කරන ලදී. 1990 නොවැම්බර් මස මැද භාගයේ සිට ක්‍රියාත්මක වූ නව නිෂ්පාදන බදු මගින් ලැබූ ආදායම රුපියල් දශ ලක්ෂ 52 ක් විය.

ජාත්‍යන්තර වෙළඳාම හා පදනම් වූ බදු මගින් රුපියල් දශ ලක්ෂ 19,341 ක් උපයාගන්නා ලද අතර, එය පසුගිය වසරේ රුපියල් දශ ලක්ෂ 16,495 ක් විය. ආනයන වටිනාකම සියයට 34 කින් වර්ධනය වුවද රුපියල් දශ ලක්ෂ 16,792 ක් වූ ආනයන බදු ආදායම 1989 ආදායම් එකතුවට වඩා සියයට 12.5 ක සාමාන්‍ය වර්ධනයක් පමණක් පෙන්නුම් කරන ලදී. මේ අනුව සාමාන්‍ය ආනයන බදු අනුපාතය 1989 සියයට 18.6 සිට 1990 දී සියයට 15.6 දක්වා පහත වැටුණි. කෙසේ වුවද, 1990 දී ආනයනය කළ යන්ත්‍රසූත්‍ර-යාන්ත්‍රික උපකරණ, විදුලි උපකරණ මෝටර්රථ හා ඒවායේ අමතර කොටස්, ඡායාරූප ශිල්පීය, සංගීත සහ විද්‍යුත් උපකරණ සහ උපකාරක භාණ්ඩ යනාදිය මත පැනවූ ආනයන බදු වලින් ලද ආදායම රුපියල් දශ ලක්ෂ 4,140 වූ අතර, එය සියයට 41 ක වර්ධනයක් වාර්තා කළේය. 1990 බණිජ තෙල් නිෂ්පාදන ද ඇතුලත්ව අන්තර් භාණ්ඩ මත පැනවූ ආනයන බදු වලින් ලද ආදායම රුපියල් දශ ලක්ෂ 7,330 ක් වූ අතර, එය 1989 රුපියල් දශ ලක්ෂ 6,534 ක් විය. අපනයන බදු වලින් ලද ආදායම රුපියල් දශ ලක්ෂ 2,549 ක් වූ අතර, එය 1989 දී රුපියල් දශ ලක්ෂ 1,572 ක් විය. තේ මිළෙහි පැවති යහපත් ප්‍රවනතා හා අපනයන ප්‍රමාණයේ වැඩිවීම යන හේතු දෙකෙහිම ප්‍රතිඵලයක් ලෙස 1990 රුපියල් දශ ලක්ෂ 1,601 ක්වූ තේ අපනයන ආදායම දෙගුණයකටත් වැඩි වර්ධනයක් පෙන්නුම් කළේය.

රුපියල් දශ ලක්ෂ 7,337 ක් වූ සාමුහික හා පෞද්ගලික ආදායම් බදු වලින් ලද ආදායම සියයට 43 ක වැඩිවීමක් වාර්තා කළේය. රුපියල් දශ ලක්ෂ 2,957 ක් වූ පෞද්ගලික ආදායම් බදු ආදායම සියයට 34 ක වර්ධනයක් වාර්තා කළ අතර, සාමුහික අංශයෙන් ලද රුපියල් දශ ලක්ෂ 4,380 බදු ආදායම සියයට 49 ක වර්ධනයක් පෙන්විය. 1990 දී ඇතිවූ මූල්‍ය ආදායමෙහි වූ සීඝ්‍ර වර්ධනය මෙම වැඩිවීමට බලපෑ ප්‍රධාන සාධකය විය. රජයේ ආදායම් පිළිබඳ සංඛ්‍යාත්මක සුම්පිණ්ඩනයක් 1.49 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**විදේශීය ප්‍රදානයන්**

1990 අයවැය කටයුතු සඳහා උපයෝජනය කළ මුළු විදේශ ප්‍රදානයන් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,697 ක් වූ අතර, පෙර වර්ෂයේ එහි සංසන්දනාත්මක වටිනාකම රුපියල් දශ ලක්ෂ 6,407 ක් විය. විදේශ ප්‍රදානයන් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස ගත් කළ 1989 වසරේ සියයට 2.5 සිට 1990 වසරේදී සියයට 2.1 දක්වා පහත වැටුණි. 1990 දී රුපියල් දශ ලක්ෂ 5,801 ක් වූ ව්‍යාපෘති දීමනා පෙර වර්ෂයට වඩා සියයට 15 ක වැඩිවීමකි. භාණ්ඩ හා ආහාර ආධාර ප්‍රදානයන් යටතේ රුපියල් දශ ලක්ෂ 896 ක් ලැබුණ අතර එය පසුගිය වර්ෂයට වඩා සියයට 35 ක අඩුවීමකි. ජපානයෙන් ලැබුණ රුපියල් දශ ලක්ෂ 3,065 ක ප්‍රදානයන් අයවැය කටයුතු සඳහා යොදාගත් මුළු ප්‍රදානයන්ගෙන් සියයට 46 ක් වූ අතර, පසුගිය වසරේ එය සියයට 40 ක් විය.

## 1.49 සංඛ්‍යා සටහන

## රජයේ ආදායම් සංයුතියෙහි සම්පිණ්ඩනය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදායම** | **31,272** | **35,119** | **35,946** | **47,513** | **55,920** | **61,206** | **64,899** |
| ආදායම් බදු | 4,787 | 4,909 | 4,647 | 5,148 | 6,700 | 7,337 | 7,840 |
| සාමූහික නොවන | 1,513 | 1,580 | 1,464 | 2,207 | 2,455 | 2,957 | 3,190 |
| සාමූහික | 3,274 | 3,329 | 3,183 | 2,941 | 4,245 | 4,380 | 4,650 |
| දේපොල බදු | 648 | 1,568 | 1,777 | 2,697 | 2,525 | 3,140 | 2,937 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | — | — | — | 2,345 | 3,350 | 2,618 | 2,500 |
| දේශීය භාණ්ඩ හා සේවාවන් මත බදු | 14,787 | 15,667 | 17,021 | 20,828 | 25,973 | 28,770 | 32,272 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් මත බදු | 10,088 | 10,611 | 12,321 | 14,658 | 17,800 | 20,291 | 22,180 |
| නිෂ්පාදන | 3,270 | 3,675 | 3,610 | 4,496 | 5,765 | 6,798 | 7,450 |
| නිෂ්පාදන නොවන | 2,415 | 2,426 | 3,386 | 3,004 | 4,415 | 3,726 | 3,340 |
| ආනයන | 4,403 | 4,510 | 5,325 | 7,158 | 7,620 | 9,767 | 11,390 |
| සුරා බදු | 4,414 | 4,716 | 4,420 | 5,812 | 7,780 | 8,170 | 10,060 |
| මත්පැන් | 1,485 | 1,644 | 1,754 | 1,955 | 2,440 | 2,657 | 3,010 |
| දුම්කොළ | 2,927 | 3,071 | 2,665 | 3,855 | 5,340 | 5,461 | 6,550 |
| වෙනත් | 2 | 1 | 1 | 2 | — | 52 | 500 |
| බලපත්‍ර ගාස්තු | 285 | 340 | 280 | 358 | 393 | 309 | 32 |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 11,050 | 12,975 | 12,501 | 16,495 | 17,372 | 19,341 | 19,350 |
| ආනයන 1 | 9,414 | 11,051 | 10,671 | 14,923 | 15,330 | 16,792 | 17,500 |
| අපනයන | 1,636 | 1,924 | 1,830 | 1,572 | 2,042 | 2,549 | 1,850 |
| තේ | 996 | 1,152 | 872 | 628 | 750 | 1,601 | 875 |
| ඉන් : වටිනාකම අනුව | 62 | 262 | 264 | 355 | 500 | 1,311 | 600 |
| රබර් | 307 | 530 | 842 | 766 | 1,080 | 747 | 750 |
| පොල් | 232 | 148 | 67 | 126 | 150 | 151 | 150 |
| අනෙකුත් | 101 | 94 | 49 | 52 | 62 | 50 | 75 |
| **බදු නොවන ආදායම** | **5,966** | **7,026** | **5,803** | **6,466** | **5,342** | **6,758** | **6,630** |
| දේපොල ආදායම | 4,731 | 4,541 | 4,080 | 4,387 | 3,383 | 4,192 | 3,241 |
| ඉන් : මහ බැංකුවේ ලාභාංශ | 1,779 | 1,723 | 1,650 | 2,000 | 500 | 500 | 250 |
| පොලී ආදායම | 1,560 | 1,404 | 1,451 | 1,198 | 971 | 1,143 | 951 |
| වෙළෙඳ ව්‍යවසායයන්ගේ අතිරික්තය | 803 | 1,229 | 850 | 1,041 | 1,784 | 2,235 | 1,800 |
| සේවා සහ ගාස්තු | 347 | 334 | 412 | 627 | 660 | 835 | 853 |
| අනෙකුත් 2 | 888 | 2,151 | 1,311 | 1,452 | 1,299 | 1,731 | 2,536 |
| එකතුව | 37,238 | 42,145 | 41,749 | 53,979 | 61,262 | 67,964 | 71,529 |

1. ආනයන බදු ප්‍රතිදනයන් හැර
2. ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම්ද ඇතුළත්ය.

(අනෙක් පිට හා සම්බන්ධයි.)

## 1 . 49 සංඛ්‍යා සටහන හා සම්බන්ධයි

### රජයේ ආදයම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **බදු ආදයම** | **17·4** | **17·9** | **16·2** | **18·9** | **19·7** | **19·1** | **17·7** |
| ආදයම් බදු | 2·7 | 2·5 | 2·1 | 2·0 | 2·4 | 2·3 | 2·1 |
| සාමූහික නොවන | 0·8 | 0·8 | 0·7 | 0·9 | 0·9 | 0·9 | 0·9 |
| සාමූහික | 1·8 | 1·7 | 1·4 | 1·2 | 1·5 | 1·4 | 1·3 |
| දේපොළ මත බදු | 0·4 | 8·0 | 0·8 | 1·1 | 0·9 | 1·0 | 0·8 |
| මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සඳහා බදු | — | — | — | 0·9 | 1·2 | 0·8 | 0·7 |
| දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 8·2 | 8·0 | 7·7 | 8·3 | 9·2 | 9·0 | 8·8 |
| පොදු විකුණුම් සහ පිරිවැටුම් බදු | 5·6 | 5·4 | 5·6 | 5·8 | 6·3 | 6·3 | 6·0 |
| නිෂ්පාදන | 1·8 | 1·9 | 1·6 | 1·8 | 2·0 | 2·1 | 2·0 |
| නිෂ්පාදන නොවන | 1·3 | 1·2 | 1·5 | 1·2 | 1·6 | 1·2 | 0·9 |
| ආනයන | 2·5 | 2·3 | 2·4 | 2·8 | 2·7 | 3·0 | 3·1 |
| සුරාබදු | 2·5 | 2·4 | 2·0 | 2·3 | 2·7 | 2·5 | 2·7 |
| මත්පැන් | 0·8 | 0·8 | 0·8 | 0·8 | 0·9 | 0·8 | 0·8 |
| දුම්කොළ | 1·6 | 1·6 | 1·2 | 1·5 | 1·9 | 1·7 | 1·8 |
| වෙනත් | ... | ... | ... | ... | ... | ... | 0·1 |
| බලපත්‍ර ගාස්තු | 0·2 | 0·2 | 0·1 | 0·1 | 0·1 | 0·1 | ... |
| ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු | 6·2 | 6·6 | 5·6 | 6·5 | 6·1 | 6·0 | 5·3 |
| ආනයන | 5·2 | 5·6 | 4·8 | 5·9 | 5·4 | 5·2 | 4·8 |
| අපනයන | 0·9 | 1·0 | 0·8 | 0·6 | 0·7 | 0·8 | 0·5 |
| තේ | 0·6 | 0·6 | 0·4 | 0·2 | 0·3 | 0·5 | 0·2 |
| ඉන් : වට්නාකම අනුව | ... | 0·1 | 0·1 | 0·1 | 0·2 | 0·4 | 0·2 |
| රබර් | 0·2 | 0·3 | 0·4 | 0·3 | 0·4 | 0·2 | 0·2 |
| පොල් | 0·1 | 0·1 | ... | 0·1 | 0·1 | ... | ... |
| අනෙකුත් | 0·1 | ... | ... | ... | ... | ... | ... |
| **බදු නොවන ආදයම** | **3·3** | **3·6** | **2·6** | **2·6** | **1·9** | **2·1** | **1·8** |
| දේපොල ආදයම | 2·6 | 2·3 | 1·8 | 1·7 | 1·2 | 1·3 | 0·9 |
| ඉන් : මහ බැංකුවේ ලාභ | 1·0 | 0·9 | 0·7 | 0·8 | 0·2 | 0·2 | 0·1 |
| පොළී ආදයම් | 0·9 | 0·7 | 0·7 | 0·5 | 0·3 | 0·4 | 0·3 |
| වෙළෙඳ ව්‍යවසායයන්ගේ අතිරික්තය | 0·4 | 0·6 | 0·4 | 0·4 | 0·6 | 0·7 | 0·5 |
| සේවා හා ගාස්තු | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·3 | 0·2 |
| අනෙකුත් බදු නොවන ආදයම් | 0·5 | 1·1 | 0·6 | 0·6 | 0·5 | 0·5 | 0·7 |
| එකතුව | 20·7 | 21·4 | 18·8 | 21·4 | 21·6 | 21·2 | 19·5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

DISCARDED

වර්තන වියදම්

1990 වර්තන වියදම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 71,771 පසුගිය වර්ෂයේ වූ රුපියල් දශ ලක්ෂ 56,884 ක ප්‍රමාණයට වඩා සියයට 26 ක වර්ධනයක් වාර්තා කළේය. 1990 භාණ්ඩ හා සේවා සඳහා වැය වූ රුපියල් දශ ලක්ෂ 30,167 වර්තන වියදමින් සියයට 42 ක් වූ අතර, එය 1989 සමඟ සසඳන කළ සියයට 45 ක් විය. 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 20,936 ක් වූ වර්තන පැවරුම් මුළු වර්තන වියදමින් සියයට 29 ක් වූ අතර, එය 1989 සියයට 30 ක් විය. රජයේ ණය සඳහා පොළී ගෙවීම් වූ රුපියල් දශ ලක්ෂ 20,668 වර්තන වියදමින් සියයට 29 වූ අතර, එය 1989 වසරෙහි සියයට 25 ක් විණි.

භාණ්ඩ හා සේවා සඳහා වියදමින් රුපියල් දශ ලක්ෂ 15,749 ක් වැටුප් සහ වේතන සඳහා වූ අතර, රුපියල් දශ ලක්ෂ 14,419 අනිකුත් භාණ්ඩ හා සේවා සඳහා විය. මුළු වර්තන වියදමින් පහෙන් එකක් පමණ වූ රජයේ සේවකයන්ගේ වැටුප් හා වේතන මසකට රු. 2,000 ට වඩා අඩු වැටුප් ලබන්නන් සඳහා දෙනු ලැබූ රුපියල් 200 ජීවන වියදම් දීමනාව නිසා 1990 දී සියයට 9 කින් ඉහළ ගියේය. අනිකුත් භාණ්ඩ හා සේවා සඳහා වූ වියදමට ඇතුළත් වන ගමන් වියදම්, විදුලි බල සහ විදුලි සංදේශ ගාස්තු, ද්‍රව්‍ය මිලට ගැණුම්, කාර්යාල උපකරණ සහ ආරක්ෂක සේවා සම්බන්ධ භාණ්ඩ ආදිය මුළු වියදමින් සියයට 20 ක් පමණ වූ අතර, එය 1990 වසරේදී සියයට 30 කින් වැඩි වූයේ බොහෝදුරට ආරක්ෂක වියදම්වල ඉහළයාම හේතුවෙනි.

විශ්‍රාම වැටුප් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 4,490 ක වියදම් ද ඇතුලත්ව රුපියල් දශ ලක්ෂ 20,936 ක් වූ මුළු වර්තන පැවරුම් සියයට 23 කින් ඉහළ ගිය අතර, එය ඉකුත් වසරෙහි සියයට 32 ක ඉහළ යාමකට ලක් විය. ආහාර මුද්දර, භූමිතෙල් මුද්දර, පාසැල් ළමුන්ගේ දිවා ආහාර සහ ජනසවිය වැඩපිළිවෙල ආදිය ඇතුලත් සුභසාධන වියදම් 1989 වූ රුපියල් දශ ලක්ෂ 4,992 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 8,368 දක්වා වැඩි වූයේ ජනසවිය සහ දිවා ආහාර වැඩ පිළිවෙල යටතේ වූ වියදම් ඉහළ යාම නිසාය. මේ අතර, අනෙකුත් ආධාර වැඩපිළිවෙලට අයත් නොමිලේ දෙනු ලබන පාසැල් පොත්, පාසැල් වාර ප්‍රවේශපත්‍ර,ළදරු කිරි ආහාර සහනාධාරය සඳහා මෙම වසරේදී රුපියල් දශ ලක්ෂ 444 ක් වැය කළ අතර, එය ඉකුත් වසරෙහිදී රුපියල් දශ ලක්ෂ 333 ප්‍රමාණයක් විය. වාණිජ නොවන ආයතනද ඇතුලත්ව රාජ්‍ය සංස්ථා සඳහා කරන ලද පැවරුම් රුපියල් දශ ලක්ෂ 3,827 ක්වූ අතර මින් රුපියල් දශ ලක්ෂ 1,377 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල සඳහා වැය විය. රජයේ දුම්රිය හා තැපැල් දෙපාර්තමේන්තුවල පාඩුව 1989 වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 670 සිට 1990 වසරේදී රුපියල් දශ ලක්ෂ 432 දක්වා පහත වැටුණි. මෙයට බලපෑ ප්‍රධාන හේතුව වූයේ දුම්රිය ගාස්තු ඉහළ නැංවීමය. 1990 දී ප්‍රතිව්‍යුහගත කිරීමේ වියදම් හැර රාජ්‍ය වාණිජ ආයතන සඳහා කරන ලද වර්තන පැවරුම් රුපියල් දශ ලක්ෂ 1,372 ක් වූ අතර, පෙර වර්ෂයේදී එහි සංසන්දනාත්මක අගය රුපියල් දශ ලක්ෂ 1,613 ක් විය.

රාජ්‍ය ණය සඳහා කරන ලද පොළී ගෙවීම් රුපියල් දශ ලක්ෂ 20,668 ක් විය. මෙය ඉකුත් වර්ෂයේ වියදම් වූ රුපියල් දශ ලක්ෂ 14,352 සමඟ සසඳා බලන කළ සියයට 44 ක වැඩිවීමකි. දේශීය ණය ගැනුම් මත කරන ලද පොළී ගෙවීම් සියයට 54 කින් වැඩිවී රුපියල් දශ ලක්ෂ 16,990 ක් වූ අතර, එය රුපියල් ණය සඳහා වූ රුපියල් දශ ලක්ෂ 6,857, භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 9,563 සහ වෙනත් ණය වර්ග සඳහා වූ රුපියල් දශ ලක්ෂ 570 කින්ද සමන්විතය. රුපියල් ණය සඳහා පොළී ගෙවීම් පෙර වර්ෂයට වඩා සියයට 16 කින් ඉහළ ගිය අතර, භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළී ගෙවීම් සියයට 88 කින් වැඩි විය. ලබාගත් ණය ප්‍රමාණයන් වැඩිවීම හා සාමාන්‍ය වශයෙන් සියයට 17 කට ආසන්න ඉහළ පොළී අනුපාතයක් පැවතීම මෙම වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක විය.

## 1.50 සංඛ්‍යා සටහන

### ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම්

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** .. .. | **33,966** | **39,560** | **46,132** | **56,884** | **63,562** | **71,771** | **72,962** |
| භාණ්ඩ හා සේවා සඳහා වියදම .. .. | 15,154 | 18,466 | 20,654 | 25,508 | 25,779 | 30,167 | 31,782 |
| වැටුප් හා වේතන .. .. | 8,027 | 8,006 | 10,016 | 14,446 | 14,129 | 15,749 | 18,110 |
| වෙනත් භාණ්ඩ හා සේවා .. .. | 7,127 | 10,460 | 10,638 | 11,062 | 11,650 | 14,419 | 13,672 |
| පොලී ගෙවීම් .. .. | 8,762 | 10,157 | 12,590 | 14,352 | 19,941 | 20,668 | 22,189 |
| විදේශීය .. .. | 2,209 | 2,564 | 2,896 | 3,337 | 3,461 | 3,678 | 4,382 |
| දේශීය .. .. | 6,553 | 7,593 | 9,694 | 11,015 | 16,480 | 16,990 | 17,807 |
| වර්තන පැවරුම් සහ සහනාධාර .. .. | 10,050 | 10,937 | 12,888 | 17,024 | 18,497 | 20,936 | 22,492 |
| රාජ්‍ය සංස්ථාවන්ට .. .. | 2,350 | 1,722 | 2.349 | 3,177 | 1,681 | 3,827 | 2,408 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට .. .. | 600 | 609 | 918 | 902 | 1,027 | 1.237 | 1,099 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට .. .. | 7,100 | 8,606 | 9,621 | 12,945 | 15.789 | 15.872 | 18,985 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර .. .. | 1,549 | 1,666 | 1,895 | 3,932 | 3,782 | 5,122 | 4,875 |
| ජනසවිය .. .. | — | — | — | 705 | 4,400 | 2,912 | 4,900 |
| විශ්‍රාම වැටුප් .. .. | 2,984 | 3,242 | 4,128 | 4,735 | 4,967 | 4,490 | 6,333 |
| පොහොර සහනාධාර .. .. | 614 | 511 | 600 | 796 | — | — | — |
| වෙනත් .. .. | 1,953 | 3,187 | 2,998 | 2,777 | 2,640 | 3,348 | 2,877 |
| ඌන වියදම් සඳහා ප්‍රතිපාදන .. .. | — | — | — | — | - 656 | — | - 3,500 |
| **ප්‍රාග්ධන වියදම** .. .. | **23,236** | **22,816** | **22,878** | **20,750** | **21,653** | **19,161** | **28,118** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් .. .. | 7,788 | 10,983 | 12,006 | 13,069 | 13,336 | 11,664 | 16,460 |
| ප්‍රාග්ධන පැවරුම් .. .. | 15,448 | 11,833 | 10,872 | 7,681 | 9,767 | 7,497 | 14,659 |
| රාජ්‍ය සංස්ථාවන්ට .. .. | 14,874 | 11,185 | 9,684 | 6,330 | 7,792 | 5,815 | 12,047 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට .. .. | 472 | 571 | 1,123 | 1,322 | 1,715 | 1,574 | 2,311 |
| වෙනත් .. .. | 101 | 77 | 65 | 29 | 260 | 109 | 301 |
| ඌන වියදම් සඳහා ප්‍රතිපාදන .. | — | — | — | — | - 1,450 | — | - 3,000 |
| **ආපසු ගෙවීම් අඩුකළ පසු ණයදීම්** .. .. | **1,991** | **1,518** | **7,522** | **4,530** | **4,647** | **8,882** | **6,471** |
| ඉන් : අත්තිකාරම් ගිණුම් යටතේ .. .. | - 170 | - 1,180 | 2,732 | - 993 | 250 | 1,699 | 250 |
| **එකතුව** .. .. | **59,193** | **63,894** | **76,532** | **82,164** | **89,862** | **99,814** | **107,551** |

(අනෙක් පිටුව හා සම්බන්ධයි).

## 1 . 50 සංඛ්‍යා සටහන

### ආර්ථික වර්ගීකරණයට අනුව වියදම සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම් (ද. දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස)

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත කළ ඇස්තමේන්තු | 1990 තාවකාලික | 1991 අනුමත කළ ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම්** .. | **18·9** | **20·1** | **20·8** | **22·6** | **22·4** | **22·4** | **19·9** |
| භාණ්ඩ සහ සේවා සඳහා වියදම් .. | 8·5 | 9·4 | 9·3 | 10·1 | 9·1 | 9·4 | 8·7 |
| වැටුප් සහ වේතන .. | 4·5 | 4·1 | 4·5 | 5·7 | 5·0 | 4·9 | 4·9 |
| වෙනත් භාණ්ඩ හා සේවා .. | 4·0 | 5·3 | 4·8 | 4·4 | 4·1 | 4·5 | 3·7 |
| පොළී ගෙවීම් .. | 4·9 | 5·2 | 5·7 | 5·7 | 7·0 | 6·4 | 6·0 |
| විදේශීය .. | 1·2 | 1·3 | 1·3 | 1·3 | 1·2 | 1·1 | 1·2 |
| දේශීය .. | 3·7 | 3·9 | 4·4 | 4·4 | 5·8 | 5·3 | 4·9 |
| වර්තන පැවරුම් සහ සහනාධාර .. | 5·6 | 5·6 | 5·8 | 6·8 | 6·5 | 6·5 | 6·1 |
| රාජ්‍ය සංස්ථාවන්ට .. | 1·3 | 0·9 | 1·1 | 1·3 | 0·6 | 1·2 | 0·7 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට .. | 0·3 | 0·3 | 0·4 | 0·4 | 0·4 | 0·4 | 0·3 |
| කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට .. | 4·0 | 4·4 | 4·3 | 5·1 | 5·6 | 4·9 | 5·2 |
| ආහාර මුද්දර, ආහාර සහනාධාර .. | 0·9 | 0·9 | 0·9 | 1·6 | 1·3 | 1·6 | 1·3 |
| ජනසවිය .. | — | — | — | 0·3 | 1·6 | 0·9 | 1·3 |
| විශ්‍රාම වැටුප් .. | 1·7 | 1·7 | 1·9 | 1·9 | 1·8 | 1·4 | 1·7 |
| පොහොර සහනාධාර .. | 0·3 | 0·3 | 0·3 | 0·3 | — | — | — |
| වෙනත් .. | 1·1 | 1·6 | 1·4 | 1·1 | 0·9 | 1·0 | 0·8 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන .. | — | — | — | — | - 0·2 | — | - 1·0 |
| **ප්‍රාග්ධන වියදම** .. | **12·9** | **11·6** | **10·3** | **8·2** | **7·6** | **6·0** | **7·7** |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් .. | 4·3 | 5·6 | 5·4 | 5·2 | 4·7 | 3·6 | 4·5 |
| ප්‍රාග්ධන පැවරුම් .. | 8·6 | 6·0 | 4·9 | 3·0 | 3·4 | 2·3 | 4·0 |
| රාජ්‍ය සංස්ථාවන්ට .. | 8·3 | 5·7 | 4·4 | 2·5 | 2·7 | 1·8 | 3·3 |
| වෙනත් රාජ්‍ය ආයතනයන්ට .. | 0·3 | 0·3 | 0·5 | 0·5 | 0·6 | 0·5 | 0·6 |
| වෙනත් .. | 0·1 | ... | ... | ... | 0·1 | ... | 0·1 |
| ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන .. | — | — | — | — | - 0·5 | — | - 0·8 |
| **ආපසු ගෙවීම් අඩු කළ පසු ණය දීම්** .. | **1·1** | **0·8** | **3·4** | **1·8** | **1·6** | **2·8** | **1·8** |
| ඉන්: අත්තිකාරම් ගිනුම් යටතේ .. | - 0·1 | -0·6 | 1·2 | - 0·4 | 0·1 | 0·5 | 0·1 |
| **එකතුව** .. | **33·0** | **32·5** | **34·5** | **32·6** | **31·7** | **31·1** | **29·3** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම

1990 වර්ෂයේ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 19,161 ක් වූ අතර, එය 1989 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 20,750 ක් විය. මේ අනුව දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතිකව ප්‍රාග්ධන වියදම් 1989 පැවති සියයට 8.2 සිට 1990 වර්ෂයේදී සියයට 6 දක්වා පහත වැටුණි. ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම ගොඩ නැගීම හා පවත්වාගෙන යාම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 11,664 ක් වූ අතර, ඉකුත් වර්ෂයේදී එම වියදම රුපියල් දශ ලක්ෂ 13,069 ක් විය. 1989 දී රුපියල් දශ ලක්ෂ 6,330 ක්ව පැවති ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජයේ සංස්ථාවලට කරන ලද ප්‍රාග්ධන පැවරුම් 1990 දී රුපියල් දශ ලක්ෂ 5,815 දක්වා පහත වැටුණි. මුළු ප්‍රාග්ධන පැවරුම් වලින් රුපියල් දශ ලක්ෂ 1,870 ක් මහා මාර්ග යථා තත්ත්වයට පත්කිරීමේ වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ප්‍රයෝජනයට ගන්නා ලදී. මේ අතර 1989 දී රුපියල් දශ ලක්ෂ 2,475 ක්වූ මහවැලි සංවර්ධන අධිකාරියේ ප්‍රාග්ධන වියදම 1990 දී රුපියල් දශ ලක්ෂ 1,810 දක්වා පහත වැටුණි.

1990 වර්ෂයේ ආපසු ගෙවීම් අඩු කළ පසු ණයදීමේ (ශුද්ධ ණයදීම්) ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 8,882 ක් වූ අතර, එය 1989 දී රුපියල් දශ ලක්ෂ 4,530 ක් විය. පෙර වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 993 ක් වූ අත්තිකාරම් ගිණුමේ අතිරික්තය රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ සහ බෙහෙත් ගබඩා අත්තිකාරම් ගිණුමේ ඇති වූ ගෙවීම් හේතුකොට 1990 වර්ෂයේදී ශුද්ධ ගෙවීම් රුපියල් දශ ලක්ෂ 1,699 ක් බවට පත්විය. රාජ්‍ය සංස්ථාවලට මූල්‍ය වත්කම් අත්පත්කර ගැනීම සඳහා ණයදීම් රුපියල් දශ ලක්ෂ 7,587 ක් විය. පෙර වර්ෂයේ එම වටිනාකම රුපියල් දශ ලක්ෂ 5,901 කි. සමනල වැව සහ රන්ටැඹේ විදුලිබල ව්‍යාපෘතීන්හි සංවර්ධන කටයුතු සඳහා විදුලිබල මණ්ඩලයට සපයන ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,410 ක් වූ අතර, මෙය පෙර වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 3,775 ක් විය.

මුළු ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම් වලින් රුපියල් දශ ලක්ෂ 18,884 ක (හෝ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6 ක) මුදලක් පුළුල් ආර්ථික කටයුතු උදෙසා පොදු කාර්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට යොදා ගැනිණි. පසුගිය වර්ෂයෙහිදී මේ සඳහා යොදා ගත් මුදල රුපියල් දශ ලක්ෂ 18,888 (හෝ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.5 )කි. අනෙකුත් ආර්ථික සේවාවන්ට වඩා බලශක්තිය සහ ජල සම්පාදනය, කෘෂිකර්මාන්තය සහ වාරිමාර්ග, ප්‍රවාහන හා විදුලි සංදේශ යන අංශ මෙම සම්පත් වලින් විශාල ප්‍රමාණයක් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා ලදී. මුළු වියදම් හා ගෙවීම් අඩුකොට ණයදීම් පිළිබඳ ආර්ථික වර්ගීකරණයක් සංඛ්‍යා සටහන් අංක 1.50 හි දක්වා ඇත.

### අයවැය හිඟය පියවීම

පෙර වර්ෂයේ පැවති අයවැය හිඟය වූ රුපියල් දශ ලක්ෂ 21,778 ට වඩා සියයට 15 ක වැඩිවීමක් වාර්තා කරමින් 1990 වර්ෂයේ අයවැය හිඟය (දීමනාවලට පසුව) රුපියල් දශ ලක්ෂ 25,153 ක් විය. 1990 වර්ෂයේ දළ විදේශීය ණය ගැනීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 16,550 පෙර වර්ෂයට වඩා සියයට 42 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. ණය ආපසු ගෙවීම් සඳහා වූ රුපියල් දශ ලක්ෂ 4,906 අත්හළ පසු විදේශීය ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11,644 ක් වූ අතර, මෙය අයවැය කටයුතු සඳහා පෙර වර්ෂයේ ලද ප්‍රමාණය මෙන් දෙගුණයක් පමණ වේ.

අයවැය හිඟය පියවීමේදී රජය රුපියල් දශ ලක්ෂ 26,084 ක් දේශීය මූලාශ්‍රයන්ගෙන් ලබාගත් අතර, එය බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් ලැබූ රුපියල් දශ ලක්ෂ 22,535 කින් හා බැංකු මූලාශ්‍රයන්ගෙන් ලැබූ රුපියල් දශ ලක්ෂ 3,549 කින් සමන්විත විය. රුපියල් සුරැකුම් සහ ජාතික ආරක්ෂක බැඳුම්කර වැනි බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් රැස්කර ගන්නා ලද සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,846 ක් විය. කෙසේ වුවද රුපියල් සුරැකුම් ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 7,287 ක් වූ නිසා මධ්‍ය හා දිගුකාලීන රජයේ සුරැකුම්පත් තුළින් ලැබූ ශුද්ධ

## 1.51 සංඛ්‍යා සටහන


### කාර්යයන් අනුව වියදමෙහි වර්ගීකරණය

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 අනුමත-කළ ඇස්ත-මේන්තු | 1990 තාව-කාලික | 1991 අනුමත-කළ ඇස්ත මේන්තු |
|---|---|---|---|---|---|---|---|
| **වර්තන වියදම** | | | | | | | |
| සාමාන්‍ය පොදු සේවා .. | **8,689** | **11,113** | **13,424** | **14,570** | **15,340** | **17,926** | **17,113** |
| සිවිල් පරිපාලනය .. | 2,884 | 2,943 | 6,145 | 6,761 | 6,353 | 6,606 | 6,706 |
| ආරක්ෂක කටයුතු .. | 4,351 | 6,001 | 4,732 | 4,573 | 4,907 | 6,736 | 6,884 |
| පොදු නීතිය හා ආරක්ෂාව .. | 1,445 | 2,169 | 2,547 | 3,236 | 4,080 | 4,585 | 3,523 |
| සමාජ සේවා .. | **11,004** | **12,714** | **15,251** | **19,568** | **23,104** | **23,956** | **29,994** |
| අධ්‍යාපනය .. | 3,775 | 4,066 | 5,036 | 6,207 | 6,020 | 8,056 | 8,362 |
| සෞඛ්‍යය .. | 1,841 | 2,401 | 2,420 | 3,379 | 3,501 | 3,670 | 4,443 |
| සුභ සාධන .. | 5,254 | 6,098 | 7,607 | 9,750 | 13,332 | 11,968 | 16,898 |
| නිවාස .. | 13 | 13 | 15 | 17 | — | — | — |
| ප්‍රජා සේවා .. | 121 | 136 | 173 | 215 | 251 | 261 | 291 |
| ආර්ථික සේවා .. | **3,960** | **2,905** | **4,047** | **3,819** | **2,470** | **4,293** | **2,723** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග .. | 1,336 | 1,086 | 1,399 | 963 | 873 | 965 | 905 |
| ධීවර .. | 38 | 40 | 40 | 47 | 46 | 46 | 54 |
| නිෂ්පාදනය සහ කැනීම් .. | 443 | 141 | 197 | 408 | 174 | 181 | 240 |
| බලශක්ති සහ ජල සම්පාදන .. | 50 | 73 | 80 | 415 | 170 | 345 | 279 |
| ප්‍රවාහන සහ සම්බන්ධතා .. | 1,668 | 1,200 | 1,613 | 1,138 | 1,072 | 2,600 | 1,100 |
| වෙළෙඳාම සහ වාණිජ්‍යය .. | 152 | 190 | 415 | 849 | 134 | 156 | 145 |
| වෙනත් .. | 273 | 175 | 304 | — | — | — | — |
| අනෙකුත් .. | **10,323** | **12,828** | **13,410** | **18,927** | **22,648** | **25,597** | **23,132** |
| ඉන් : පොළී ගෙවීම් .. | 8,762 | 10,157 | 12,590 | 14,352 | 19,941 | 20,668 | 22,189 |
| ඌණ වියදම් ප්‍රතිපාදන .. | — | — | — | — | - 656 | — | - 3,500 |
| **මුළු වර්තන වියදම** .. | **33,966** | **39,560** | **46,132** | **56,884** | **63,562** | **71,771** | **72,962** |
| **ප්‍රාග්ධන වියදම් සහ ණය දීම්** | | | | | | | |
| සාමාන්‍ය පොදු සේවා .. | **1,217** | **1,676** | **2,772** | **2,503** | **2,221** | **3,617** | **2,735** |
| සිවිල් පරිපාලනය .. | 864 | 870 | 2,133 | 2,002 | 1,693 | 1,599 | 2,010 |
| පොදු නීතිය හා ආරක්ෂාව .. | 353 | 806 | 639 | 501 | 528 | 2,018 | 725 |
| සමාජ සේවා .. | **2,567** | **2,817** | **2,883** | **3,443** | **3,483** | **2,800** | **4,965** |
| අධ්‍යාපනය .. | 1,252 | 787 | 855 | 1,417 | 1,281 | 944 | 1,961 |
| සෞඛ්‍යය .. | 405 | 979 | 1,498 | 1,246 | 1,619 | 1,259 | 2,321 |
| සුභ සාධන .. | 15 | 53 | 13 | 10 | 25 | 25 | 21 |
| නිවාස .. | 575 | 505 | 429 | 687 | 428 | 413 | 360 |
| ප්‍රජා සේවා .. | 320 | 493 | 88 | 83 | 130 | 160 | 302 |
| ආර්ථික සේවා .. | **21,547** | **20,834** | **21,128** | **18,888** | **20,356** | **18,884** | **27,642** |
| කෘෂිකර්මය හා වාරිමාර්ග .. | 8,217 | 8,484 | 6,412 | 5,206 | 6,289 | 5,096 | 6,943 |
| ඉන් : මහවැලි යෝජනා ක්‍රමය .. | 5,952 | 5,101 | 3,430 | 2,475 | 2,861 | 1,810 | 3,178 |
| ධීවර .. | 223 | 294 | 140 | 283 | 270 | 133 | 269 |
| නිෂ්පාදනය හා කැනීම් .. | 793 | 1,162 | 330 | 471 | 144 | 109 | 158 |
| බලශක්ති හා ජල සම්බන්ධතා .. | 2,476 | 3,226 | 5,451 | 4,647 | 4,861 | 6,413 | 7,413 |
| ප්‍රවාහන හා සම්බන්ධතා .. | 7,648 | 5,633 | 6,264 | 6,666 | 6,078 | 4,312 | 8,664 |
| වෙළෙඳාම හා වාණිජ්‍යය .. | 445 | 309 | 103 | 47 | 6 | 5 | 232 |
| වෙනත් .. | 1,746 | 1,727 | 2,428 | 1,567 | 2,709 | 2,817 | 3,963 |
| අනෙකුත් .. | **574** | **648** | **1,188** | **1,351** | **1,975** | **1,682** | **2,612** |
| ඌන වියදම් ප්‍රතිපාදන .. | — | — | — | — | - 1,450 | — | - 3,000 |
| **ප්‍රාග්ධන වියදම හා ණය දීම්** .. | **25,905** | **25,975** | **27,971** | **26,185** | **26,585** | **26,984** | **34,954** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## රාජ්‍ය ණය සංයුතිය




* දළ රාජ්‍ය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු.

ශ්‍රී ලංකා මහ බැංකුව.

ණය ගැනීම් (රුපියල් සුරකුම් හා ජාතික ආරක්ෂක බැඳුම්කර) රුපියල් දශ ලක්ෂ 5,559 ක් පමණක් විය. මේ අතර භාණ්ඩාගාර බිල්පත් (කෙටිකාලීන රජයේ සුරකුම්) මගින් තවත් රුපියල් දශ ලක්ෂ 7,401 ක් බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් රැස්කර ගැනීමට සමත් විය. සෘජු පාලනයට හසුවන සම්ප්‍රදායික මූලාශ්‍රයන් වන සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.), ජාතික ඉතිරි කිරීමේ බැංකුව (ජා.ඉ.බැ.), සේවක භාරකාර අරමුදල (සේ.භා.අ.) සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කෙටිකාලීන හා දිගුකාලීන රජයේ සුරකුම් සඳහා ප්‍රධාන වශයෙන් මුදල් ආයෝජනයකළ ආයතන විය. මේ අතර පෞද්ගලික අංශය සෘජු ලෙස අයවැය හිඟය පියවීම සඳහා රුපියල් දශ ලක්ෂ 3,401 කින් දායක වූ අතර 1989 දී මෙම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,955 ක් විය. ඒ අනුව බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් ලැබූ ශුද්ධ දේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 15,241 ක් වූ අතර, එය 1989 දී රුපියල් දශ ලක්ෂ 15,659 ක් විය.

1990 දී බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ලද ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,549 ක් වූ අතර, පෙර වර්ෂයේදී එය රුපියල් දශ ලක්ෂ 1,132 ක් විය. එසේ වුවද, බැංකු ක්‍රමයට ණය ආපසු ගෙවීම් රුපියල් දශ ලක්ෂ 11 ක් සහ රජයේ තැන්පතු ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,165 කින් වැඩිවීම හේතුකොට අයවැය හිඟය පියවීම සඳහා බැංකු ක්‍රමයෙන් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 374 ක් විය.

**රාජ්‍ය ණය**

1990 වර්ෂය අවසානයේදී නොපියවූ මුළු රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 310,780 ක් වූ අතර එය පසුගිය වර්ෂය අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 273,860 ට වඩා සියයට 11 ක වැඩි වීමකි. පෙර වර්ෂයේදී මෙන්ම, දේශීය ණය ප්‍රමාණය නොපියවන ලද මුළු රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 43 ක් විය. රුපියල් දශ ලක්ෂ 67,968 ක් වූ නොපියවූ භාණ්ඩාගාර බිල්පත් මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 51 ක් වූ අතර, පෙර වර්ෂයේදී එය සියයට 49 ක් විය. කෙසේ වුවද, මහ බැංකුව සතු නොපියවන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1989 අවසානයේදී සියයට 60 සිට 1990 අවසානය වනවිට සියයට 45 දක්වා පහත වැටුණි. බැංකු නොවන අංශය සතු වූ නොපියවන ලද ණය ප්‍රමාණය කලින් වර්ෂයේ වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 68,399 සිට 1990 දී රුපියල් දශ ලක්ෂ 83,981 දක්වා ඉහළ නැගුණි. මේ අතර රුපියල් දශ ලක්ෂ 176,883 ක් වූ නොපියවන ලද විදේශීය ණය ප්‍රමාණය කලින් වර්ෂයට වඩා සියයට 13 ක වැඩිවීමක් වාර්තා කරන ලදී. මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් ව්‍යාපෘති ණය ප්‍රමාණය පසුගිය වර්ෂයේ සියයට 72 සිට සියයට 75 දක්වා වැඩි විය. ස්වභාවය සහ හිමිකම අනුව නොපියවූ රාජ්‍ය ණය පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන අංක 1.52 හි දක්වා ඇත.

**දේශීය ණය**

පසුගිය වර්ෂයේ සියයට 19 ක වැඩි වීමත් සමග සසඳන විට 1990 රුපියල් දශ ලක්ෂ 133,897 ක් වූ මුළු දේශීය ණය ප්‍රමාණය සියයට 14 ක වැඩි වීමක් වාර්තා කරන ලදී. රුපියල් දශ ලක්ෂ 48,254 ක් වූ බැංකු අංශය විසින් දරණ ලද මුළු දේශීය ණය ප්‍රමාණය සියයට 3 ක වර්ධනයක් වාර්තා කරන ලදී. කලින් වර්ෂයේ සියයට 40 සමග සසඳන විට 1990 වර්ෂය අවසානයේදී මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 36 ක් බැංකු අංශය විසින් දරන ලදී. රුපියල් දශ ලක්ෂ 85,643 ක් වූ බැංකු නොවන අංශය විසින් දරන ලද දේශීය ණය ප්‍රමාණය සියයට 21 ක වැඩිවීමක් වාර්තා කළ අතර එය 1989 දී සියයට 26 ක වර්ධනයක් වාර්තා කළේය.

1990 අවසානයේදී මැදි හා දිගුකාලීන (කල්පිරීමේ කාලසීමාව වසරකට වැඩි) දේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 59,454 ක් විය. එය මෙම වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 5,037 ක වැඩි වීමකි. 1990 දී වැඩි වූ මැදි හා දිගුකාලීන දේශීය ණය වලින් විශාල ප්‍රමාණයක්, ජාතික ආරක්ෂක බැඳුම්කර මගින් ලබාගත් ඒවා විය. රුපියල් දශ ලක්ෂ 74,444 ක් වූ නොපියවන ලද කෙටිකාලීන දේශීය ණය ප්‍රමාණය, පසුගිය වර්ෂය අවසානයේදී වූ රුපියල් දශ ලක්ෂ 63,146 ට වඩා රුපියල් දශ ලක්ෂ 11,298 කින් ඉහළ යාමකි. කෙටිකාලීන ණයවල මෙම වර්ධනයට හේතු වූයේ රුපියල් දශ ලක්ෂ 10,437 ක් තරම් වූ විශාල ණය ප්‍රමාණයක් භාණ්ඩාගාර බිල්පත් මගින් ලබා ගැනීමය.

## 1 . 52 සංඛ්‍යා සටහන


### නොපිය වූ රාජ්‍ය ණය (වසර අවසානයට) 1986 — 1990

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | වර්ෂය | | | | | වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1986 | 1987 | 1988 | 1989 | 1990 | 1987 | 1988 | 1989 | 1990 |
| **දේශීය ණය** .. | **69,498** | **78,999** | **98,596** | **117,562** | **133,897** | **9,501** | **19.597** | **18,967** | **16,334** |
| මැදි හා දිගු කාලීන .. | 39,285 | 45,149 | 49,970 | 54,417 | 59,454 | 5,864 | 4,821 | 4,447 | 5.038 |
| කෙටි කාලීන .. | 30,213 | 33,850 | 48,626 | 63,146 | 74,444 | 3,637 | 14,776 | 14,520 | 11,298 |
| ණය උපකරණ අනුව : | | | | | | | | | |
| රුපියල් ණය .. | 39,130 | 44.958 | 49,797 | 54.217 | 54,677 | 5.828 | 4,839 | 4.420 | 460 |
| භාණ්ඩාගාර බිල්පත් .. | 26,173 | 29,850 | 43,700 | 57,246 | 67,968 | 3.677 | 13,850 | 13,546 | 10,722 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර .. | — | — | — | — | 4,532 | — | — | — | 4,592 |
| භාණ්ඩාගාර තැන්පතු සහතික .. | — | — | — | — | 109 | — | — | — | 109 |
| වෙනත් .. | 4,195 | 4,191 | 5,099 | 6,100 | 6,611 | - 4 | 908 | 1,001 | 512 |
| ආයතන අනුව : .. | | | | | | | | | |
| බැංකු අංශය .. | 27,193 | 30,535 | 42,347 | 46.874 | 48,254 | 3,342 | 11,813 | 4.527 | 1,380 |
| මහ බැංකුව .. | 26,190 | 26,324 | 38,228 | 40,025 | 37,080 | 134 | 11,904 | 1,798 | -2,946 |
| ණය උපකරණ අනුව : .. | | | | | | | | | |
| රුපියල් ණය .. | 36 | 36 | 32 | 27 | 18 | — | - 4 | - 5 | - 10 |
| භාණ්ඩාගාර බිල්පත් .. | 22,114 | 22,288 | 33,270 | 34.098 | 30,654 | 174 | 10,982 | 829 | - 3,444 |
| අත්තිකාරම් .. | 4,040 | 4,000 | 4,926 | 5,900 | 6,408 | - 40 | 926 | 974 | 508 |
| වෙළෙඳ බැංකු .. | 1,003 | 4,211 | 4,120 | 6,849 | 11,175 | 3,208 | - 91 | 2,730 | 4,325 |
| ණය උපකරණ අනුව : .. | | | | | | | | | |
| රුපියල් ණය .. | 852 | 845 | 594 | 566 | 565 | - 7 | - 251 | - 28 | - 1 |
| භාණ්ඩාගාර බිල්පත් .. | 150 | 3.365 | 3,525 | 6,282 | 10,604 | 3.215 | 160 | 2,758 | 4,322 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර .. | — | — | — | — | 5 | — | — | — | 5 |
| වෙනත් .. | 1 | 1 | 1 | 1 | 1 | — | — | — | — |
| ආයතන අනුව : .. | 1,003 | 4,211 | 4,120 | 6,849 | 11,175 | 3.208 | - 91 | 2.729 | 4,326 |
| ලංකා බැංකුව .. | 294 | 788 | 1,030 | 1,707 | 6,841 | 494 | 242 | 677 | 5,134 |
| මහජන බැංකුව .. | 706 | 2,871 | 1,894 | 3,265 | 2,062 | 2.165 | - 977 | 1,371 | - 1,204 |
| වෙනත් .. | 3 | 552 | 1,196 | 1,877 | 2,272 | 549 | 644 | 681 | 395 |
| බැංකු නොවන අංශය .. | 37,497 | 43,989 | 53,416 | 68.399 | 83,981 | 6.492 | 9,427 | 14,983 | 15,582 |
| ණය උපකරණ අනුව : .. | | | | | | | | | |
| රුපියල් ණය .. | 33,434 | 39,602 | 46,339 | 51,335 | 52,433 | 6,168 | 6,737 | 4,996 | 1,098 |
| භාණ්ඩාගාර බිල්පත් .. | 3,909 | 4,197 | 6,906 | 16,865 | 26,710 | 288 | 2,708 | 9,960 | 9,845 |
| ජාතික ආරක්ෂක බැඳුම්කර .. | — | — | — | — | 4,527 | — | — | — | 4,527 |
| භාණ්ඩාගාර තැන්පතු සහතික .. | — | — | — | — | 109 | — | — | — | 109 |
| වෙනත් .. | 154 | 190 | 172 | 199 | 202 | 36 | - 18 | 27 | 4 |
| ආයතන අනුව : .. | | | | | | | | | |
| ජා. ඉතිරි කිරීමේ බැංකුව .. | 14,025 | 16,113 | 17,952 | 18,960 | 24,190 | 2,088 | 1,839 | 1,008 | 5,230 |
| වෙනත් ඉතිරි කිරීම් ආයතන .. | 1,626 | 2.528 | 6,081 | 15,175 | 20,960 | 902 | 3.553 | 9,094 | 5,785 |
| සේ. අ. අරමුදල .. | 17,285 | 21,190 | 25,816 | 31,648 | 36.851 | 3.905 | 4,626 | 5,832 | 5,203 |
| රක්ෂණ සමාගම් .. | 4,120 | 3,874 | 3,289 | 2,387 | 1,742 | - 246 | - 585 | - 902 | - 645 |
| වෙනත් .. | 441 | 284 | 278 | 229 | 238 | - 157 | - 6 | - 49 | 9 |
| දෙපාර්තමේන්තු සහ වෙනත් නිල අරමුදල් .. | 294 | 103 | 115 | 39 | 44 | - 191 | 12 | - 76 | 5 |
| විදේශීය පරිපාලන ණය .. | 147 | 181 | 163 | 190 | 195 | 34 | - 18 | 27 | 5 |
| නිදන් අරමුදල් .. | 4,808 | 4,475 | 2,832 | 2.289 | 1,662 | - 333 | -1,643 | - 543 | - 627 |
| රුපියල් ණය .. | 4,808 | 4,475 | 2,832 | 2,289 | 1,662 | - 333 | -1,643 | - 543 | - 627 |
| **විදේශීය ණය** .. | **88,304** | **112,441** | **125,657** | **156,298** | **176,883** | **24,137** | **13,216** | **30,641** | **20,585** |
| ස්වරූපය අනුව : .. | | | | | | | | | |
| ව්‍යාපෘති ණය .. | 53,897 | 73,356 | 85,745 | 113,120 | 132,338 | 19.459 | 12,389 | 27,375 | 19,218 |
| ව්‍යාපෘති නොවන ණය .. | 34,407 | 39,085 | 39,912 | 43,178 | 44,545 | 4,678 | 827 | 3,266 | 1.367 |
| භාණ්ඩ ණය .. | 26,383 | 32.894 | 35,886 | 41,117 | 43,393 | 6,511 | 2.992 | 5,231 | 2,276 |
| වෙනත් .. | 8,024 | 6,191 | 4,026 | 2,061 | 1,152 | -1,833 | -2,165 | -1,965 | - 909 |
| ආයතන අනුව : .. | | | | | | | | | |
| සහනදායී ණය .. | 78,013 | 101,300 | 115,288 | 146,144 | 166,202 | 23,287 | 13,988 | 30,856 | 20.058 |
| බහු පාර්ශ්වීය .. | 24,648 | 31,453 | 36,409 | 48,698 | 59,526 | 6.805 | 4,956 | 12,289 | 10,828 |
| ද්වි පාර්ශ්වීය .. | 53,365 | 69,847 | 78,879 | 97,446 | 106,676 | 16,482 | 9,032 | 18,567 | 9,230 |
| වෙළෙඳ ණය .. | 10,291 | 11,141 | 10,369 | 10,154 | 10,680 | 850 | - 772 | - 215 | 526 |
| සැපයුම් කරුවන්ගේ ණය .. | 515 | 525 | 340 | 333 | 107 | 10 | - 185 | - 7 | - 226 |
| **මුළු රාජ්‍ය ණය** .. | **157,802** | **191,440** | **224,253** | **273,860** | **310.780** | **33.638** | **32,813** | **49,607** | **36,920** |
| **නිදන් අරමුදල් අත්හළ පසු මුළු රාජ්‍ය ණය** .. | **151,785** | **186,262** | **220,059** | **270,609** | **308,412** | **34.477** | **33,797** | **50,550** | **37,803** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# දේශීය ණය සංයුතිය




* දළ දේශීය ණය වලින් නිදන් අරමුදල් අඩු කළ පසු.

ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් ණය යටතේ නොපියවූ වගකීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 54,677 පෙර වර්ෂයට වඩා සුළු වැඩි වීමක් වාර්තා කරන ලදී. පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8,672 ක් සමග සසඳන විට මෙම වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 8,314 ක් රුපියල් ණය යටතේ ලබා ගන්නා ලදී. කෙසේ නමුත්, රුපියල් දශ ලක්ෂ 568 ක නිදන් අරමුදල් ශේෂයන් ද ඇතුළත්ව රුපියල් දශ ලක්ෂ 7,854 ක ණය ආපසු ගෙවීම් සිදු වූයෙන් නොපියවූ රුපියල් ණය ප්‍රමාණය වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 460 කින් පමණි. සේවක අර්ථසාධක අරමුදල රුපියල් දශ ලක්ෂ 5,896 ක් රුපියල් ණයවල ආයෝජනය කළ අතර, ජාතික ඉතිරි කිරීමේ බැංකුව රුපියල් දශ ලක්ෂ 1,975 කින් දායක විය. මේ අතර 1990 අනෙකුත් අර්ථසාධක අරමුදල් විසින් රුපියල් දශ ලක්ෂ 329 ක් රුපියල් සුරැකුම්වල ආයෝජනය කරන ලදී. 1990 වර්ෂයේදී හඳුන්වා දෙන ලද ජාතික ආරක්ෂක බැඳුම්කර මගින් රුපියල් දශ ලක්ෂ 4,532 ක් ලබා ගන්නා ලදී. සම්ප්‍රදායිකව සෘජු පාලනයට හසුවන මූලයයන්, විශේෂයෙන්ම සේවක අර්ථසාධක අරමුදල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව රුපියල් දශ ලක්ෂ 3,586 කින් ජාතික ආරක්ෂක බැඳුම්කර සඳහා දායක වූ අතර, සේවක භාරකාර අරමුදල සහ රක්ෂණ සංස්ථාව රුපියල් දශ ලක්ෂ 935 කින් දායක විය.

භාණ්ඩාගාර බිල්පත් යටතේ නොපියවන ලද වගකීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 67,968 පෙර වර්ෂය අවසානයේ නොපියවන ලද වගකීම් ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 10,722 කින් ඉහළ යාමකි. 1989 දී භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් ලබාගත් මුදල රුපියල් දශ ලක්ෂ 13,546 ක් විය. බැංකු නොවන අංශය විසින් භාණ්ඩාගාර බිල්පත්වල රුපියල් දශ ලක්ෂ 9,845 ක් ආයෝජනය කළ අතර, එම ප්‍රමාණය පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 9,960 ක් විය. බැංකු නොවන අංශයේ ආයෝජනයෙන් සියයට 56 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 5,475 ක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් ලැබුණි. 1989 දී රුපියල් දශ ලක්ෂ 3,761 වූ පෞද්ගලික අර්ථසාධක අරමුදල් විසින් භාණ්ඩාගාර බිල්පත්වල කළ ආයෝජන 1990 දී රුපියල් දශ ලක්ෂ 3,072 ක් විය. මේ අතර, රාජ්‍ය සංස්ථා විසින් භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1,785 ක් විය. එය පසුගිය වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 2,888 කි.


1990 වර්ෂය තුළදී මහ බැංකු තාවකාලික අත්තිකාරම් මගින් රුපියල් දශ ලක්ෂ 508 ක් ලබා ගත් අතර, 1989 දී මෙමගින් ලබාගත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 974 ක් විය. ඒ අනුව මේ යටතේ නොපියවූ වගකීම 1989 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 5,900 සිට 1990 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 6,408 දක්වා ඉහළ නැගුණි.

**විදේශීය ණය**

1990 අවසානයේදී නොපියවූ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 176,883 ක් වූ අතර ඊට පෙර වර්ෂයේදී එය රුපියල් දශ ලක්ෂ 156,298 ක් විය. 1990 දී අයවැය කටයුතු සඳහා ලබාගත් ශුද්ධ විදේශ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 11,644 ක් වුවද, විනිමය අනුපාතිකයේ විචලනයෙන් ඇති වූ රුපියල් දශ ලක්ෂ 8,486 ක අමතර රුපියල් වගකීම නිසා නොපියවූ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 20,585 කින් වැඩි විය. රුපියල් දශ ලක්ෂ 59,526 ක් වූ බහු පාර්ශ්වීය ණය මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 34 ක් වූ අතර, පසුගිය වර්ෂයේ එය සියයට 31 ක් විය. ද්විපාර්ශ්වීය ණය රුපියල් දශ ලක්ෂ 106,676 දක්වා රුපියල් දශ ලක්ෂ 9,230 කින් වැඩි වූ අතර, එය මුළු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 60 ක් විය. 1989 දී එම අගය සියයට 62 කි.

1990 අවසානයේදී නොපියවූ ව්‍යාපෘති ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 132,338 ක් වූ අතර, එය පසුගිය වර්ෂයේ නොපියවූ ණය ප්‍රමාණයට වඩා සියයට 17 ක ඉහළ යාමකි. මෙම වර්ෂය තුළදී ව්‍යාපෘති ණය වශයෙන් ලබාගත් දළ විදේශ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ

## විදේශීය ණය සංයුතිය




ශ්‍රී ලංකා මහ බැංකුව.

14,992 ක් වූ අතර, ඉකුත් වසරේ උපයෝජනය කළ ප්‍රමාණයට වඩා එය සියයට 36 කින් වැඩි-වීමකි. මේ අතර, ණය ආපසු ගෙවීම් වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 2,325 අත්හළ පසු ව්‍යාපෘති ණය යටතේ ශුද්ධ ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,598 ක් විය. කෙසේ වුවද, විනිමය අනුපාතිකයේ විචලනය හේතුවෙන් රුපියල් දශ ලක්ෂ 6,620 ක අමතර වගකීමක් ඇතිවීම නිසා 1990 අවසානයේදී ව්‍යාපෘති ණය වගකීම රුපියල් දශ ලක්ෂ 19,218 කින් ඉහළ නැගුණි. රුපියල් දශ ලක්ෂ 2,022 ක් වූ ව්‍යාපෘති නොවන ණය යටතේ දළ ණය ලබා ගැනීම එම ණය සඳහා ආපසු ගෙවන ලද ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 2,521 ටත් වඩා අඩු විය. කෙසේ නමුත්, විනිමය අනුපාතිකයේ වූ විචලනයෙන් රුපියල් දශ ලක්ෂ 1,866 ක අමතර වගකීම් ප්‍රමාණයක් ඇති වූ අතර ඒ හේතුවෙන් නොපියවූ වගකීම් ප්‍රමාණයද ඉතා සුළු වශයෙන් ඉහළ නැගුණි. විනිමය අනුපාතිකයේ විචලනයන් විදේශ ණය කෙරෙහි කරන ලද බලපෑම සම්බන්ධ විස්තර සංඛ්‍යා සටහන් අංක 1.53 හි දක්වා ඇත.

**1.53 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතිකයේ විචලනයන් විදේශීය ණය කෙරෙහි ඇතිකළ බලපෑම 1986 – 1990 (අ)**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 තාවකාලික |
|---|---|---|---|---|---|
| 1. දළ ලැබීම .. | 12,163·5 | 10,088·2 | 12,975·3 | 12,002·8 | 16,549·6 |
| 2. ආපසු ගෙවීම .. | 3,004·6 | 4,669·9 | 5,197·2 | 5,675·4 | 4,845·7 |
| 3. ශුද්ධ ලැබීම .. | 9,158·9 | 5,418·3 | 7,778·1 | 6,327·4 | 12,098·9 |
| 4. විනිමය අනුපාතිකයේ විචලනය නිසා වගකීමෙහි ඇති වූ වෙනස .. | 9,692·4 | 18,718·5 | 5,438·0 | 23,258·8 | 8,486·3 |
| 5. කාලච්ඡේදය අවසානයෙහි වගකීම .. | 88,304·0 | 112,440·8 | 125,656·9 | 156,297·5 | 176,882·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ලැබුණු දිනය අනුව වටිනාකම සටහන් කිරීමේ ක්‍රමය පදනම් කොට ඇත.

**රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම්**

ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් ඇතුළත් වන රජයේ ණය සේවාකරණ ගෙවීම් 1990 දී රුපියල් දශ ලක්ෂ 32,878 ක් වූ අතර, එය පෙර වර්ෂයේ ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 23,890 ට වඩා සියයට 38 ක වැඩි වීමකි. මේ අනුව, රජයේ ණය සේවාකරණ ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1989 දී සියයට 9.5 සිට 1990 දී සියයට 10.2 දක්වා වර්ධනය විය. රුපියල් දශ ලක්ෂ 8,584 ක් වූ විදේශ ණය සේවාකරණ වටිනාකම සියයට 5 කින් අඩු වූ අතර, රුපියල් දශ ලක්ෂ 24,294 ක් වූ දේශීය ණය සේවාකරණ වටිනාකමෙහි සියයට 64 ක වැඩිවීමක් වාර්තා කෙරිණි. නොපියවූ රුපියල් ණය ප්‍රමාණයෙහි අසමාන කල්පිරීම් රටාව නිසා රුපියල් දශ ලක්ෂ 7,304 ක් වූ දේශීය ණය ආපසු ගෙවීම් ඉකුත් වසරේ මෙන් දෙගුණයක් තරම් වී ඇත. රුපියල් දශ ලක්ෂ 16,990 ක් වූ දේශීය ණය සඳහා පොළී ගෙවීම් පෙර වර්ෂයේ සියයට 14 ක වර්ධනයක් සමග සැසඳීමේදී සියයට 54 ක වර්ධනයක් පෙන්නුම් කළේය. පොළී

ගෙවීම් සඳහා මෙම වැඩිවීම, වර්ෂය තුළදී ගෙවීමට සිදුවූ ඉහළ පොළී අනුපාතයන් හා වැඩි වූ දේශීය ණය ප්‍රමාණයෙහි සාමූහික ප්‍රතිඵලයකි. රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ දත්තයන් සංඛ්‍යා සටහන් අංක 1.54 හි දක්වා ඇත.

### 1.54 සංඛ්‍යා සටහන

### රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම්

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1986 | 1987 | 1988 | 1989 | 1990 තාවකාලික |
|---|---|---|---|---|---|
| ණය සේවාකරණ ගෙවීම් .. | 16,287 | 15,749 | 22,270 | 23,890 | 32,878 |
| (i) ණය ආපසු ගෙවීම් .. | 7,525 | 5,592 | 9,680 | 9,538 | 12,210 |
| (අ) දේශීය (මැදි හා දිගුකාලීන) .. | 4,505 | 902 | 4,471 | 3,796 | 7,304 |
| (ආ) විදේශීය .. | 3,020 | 4,690 | 5,209 | 5,742 | 4,906 |
| (ii) පොළී ගෙවීම් .. | 8,762 | 10,157 | 12,590 | 14,352 | 20,668 |
| (අ) දේශීය .. | 6,553 | 7,593 | 9,694 | 11,015 | 16,990 |
| කෙටිකාලීන .. | 2,602 | 3,094 | 4,198 | 5,075 | 9,563 |
| මැදි හා දිගුකාලීන .. | 3,951 | 4,499 | 5,496 | 5,940 | 7,427 |
| (ආ) විදේශීය .. | 2,209 | 2,564 | 2,896 | 3,337 | 3,678 |
| පොළී ගෙවීම්/වර්තන වියදමේ කොටසක් ලෙස % .. | 25·8 | 25·7 | 27·3 | 25·2 | 28·8 |
| ණය සේවාකරණ ගෙවීම් / දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස % .. | 9·1 | 8·0 | 10·0 | 9·5 | 10·2 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.